13 වන පිටුවෙන් (අදිසි)

තිසල් පොඩි හාමුදුරුවන් දෙස බලයි. එතුමා කවුළුව තුළින් ඈත අහස දෙස බලාගත්වන ම කල්පනාවක ය.

"මොනාද අපේ හාමුදුරුවනේ මේ වෙන්නෙ..?"

පොඩි හාමුදුරුවෝ දෑහැනින් මිදී තිසල් දෙස බලති. එතුමා ගේ මුහුණේ ඇඳී ඇති උපහාසාත්මක සිනාව තිසල්ට පෙනෙයි.
"මේ කිසි දෙයක් තේරුම් ගන්න බැහැ හාමුදුරුවනේ.. මහා ප්‍රශ්න ගොඩක්.." තිසල් කියයි.

"ප්‍රශ්න ගොඩක් කියල තිසල්ට තේරෙනවද..?"

"ඇයි හාමුදුරුවනේ..?"

"ප්‍රශ්න දැන ගෙන ඉඳීම උත්තර දැනගෙන ඉඳීම තරම්ම වැදගත් තිසල්"

00000000

කොයි තරම් කාර්ය බහුල වුවද අයෝමා සිටියේ මහත් තෘප්තියකින් ය. රණසිංහගේ මැතිවරණ ව්‍යාපාරයේ සුවිසල් වැඩ කොටසක් නොදැනීම සිය කර මතට වැටී තිබීම ඇගේ සතුටට හේතු වී තිබෙයි. ඔහු තමාගේ ශක්ති පිළිබඳ තැබූ විශ්වාස ඇගේ සතුට තවත් වර්ධනය කරයි. මේ සියල්ල අනාගත ආයෝජන බව ඇයට දනියි. රැකියා විරහිත උපාධිධාරිනියක වන්නට අවශ්‍යතාවක් නැත. මේ ලැබී ඇති අවස්ථාව බුද්ධිමත් ලෙස ප්‍රයෝජනයට ගත යුතුයයි ඇය දැඩිව අදිටන් කරගෙන සිටියි.

සුනන්ද රණසිංහ හා සමීපව බොහෝ කාලයක් සිටියද රණසිංහ ලවා යමක් කරවා ගැනීමේ හැකියාවක් හෝ අවශ්‍යතාවක් හෝ ඔහුට නොවූ බව අයෝමා සිහිපත් කරන්නේ අවඥාවෙනි. සුනන්ද යනු තමන්ටවත් වෙනත් කිසිවෙකුටවත් වැඩක් නැති උදාසීන චරිතයක් පමණක් ය යන්න අයෝමාගේ තක්සේරුවයි. දේශපාලකයකුගේ සෙවණේ සරුවට වැඩෙන්නට එවන් චරිතයකට ඉඩක් නැති බව අයෝමා දනියි. තමාගේ ජීවිතයෙන් පමණක් නොව රණසිංහ ගේ ජීවිතයෙන් ද ඔහු මැකී යමින් තිබෙනු ඈ බලා සිටින්නේ උදාසීනව ය.

ජීවිතයට බොහෝ වටිනාකම් එක්වෙමින් තිබෙනු ඇයට දැනෙයි. ඉතා කුඩා කාල පරාසයක සිදුවුණ මේ පරිවර්තනය ඇයට ම අදහාගත නොහැකි තරම් ය. ප්‍රඥාරත්න ඇමති ලවා ද බොහෝ දේ ලබා ගත හැකිවනු ඇති බව නිසැක ය. ඔහු පෙරේදා ඇය කැටුව පක්ෂ මූලස්ථානයට ගියේ ය. ඒ ගමන ගියේ ඔහුගේ කරදරයෙන් ගැලවීමට නොහැකි තැන වුව ද එහි ගිය පසු ඒ ආ ගමන පිලිබඳව ඇය සතුටට පත් වූවා ය. ඔහු විසින් ඇය හඳුන්වාදෙනු ලැබුවේ තමාගේ අලුත්ම ලේකම්වරිය ලෙස ය. ප්‍රබල ඇමතිවරයකුගේ ලේකම් වරිය ලෙස හැඳින්වීමක් ලබා ගැනීම ම විශාල තෘප්තියක් ඇයට අත් කර දුන්නේ ය. ඒ ගමන පුරාම ඔහු බොහෝ සතුටින් සිටියේ ය. ජීවිතයේ ප්‍රථම වතාවට තරු පහේ හෝටලයකින් ඈ දිවා ආහාරය ගත්තා ය. මේ සියල්ල සිහිනයක් සේ ඇයට දැනෙයි. මේ සිහිනයෙන් අන්ධ නොවන්නට වග බලාගත යුතු බව ඇය දනියි.

"මැඩම්.. කෝල් එකක්.." කිසිවකු ඇගේ අතට දුරකතන දෙයි. අනෙක් කෙළවරෙන් ඇසෙන්නේ රණසිංහ ගේ කටහඬ ය.

"අද මං ආයෙ ඔෆිස් එකට එන්න නහැ අයෝ.. හෙට රැස්වීමෙ වැඩ ටික ආයෙම මුල ඉඳන් කල්පනා කරලා බලන්න.. හවස දෙකට ඇමති තුමා එයි.. සමහර විට ඔයාට එතුමා එක්ක අලුත් පක්ෂ කාර්යාලයට යන්න වෙයි.." ඔහු ගේ කටහඬ මදකට නැවතෙයි. ".. මේ වෙලාවෙ ඔයා ඉන්න එක මට හරි හයියක්.."

ළබන කළාපයට







# පාලි බොදු ගායනා සිංහලෙන්

2009 අලුත් අවුරුද්දේ මුල්ම ගී සඳළුව ලිපියෙන් අළුත් විදිහේ දෙයක් ගැන ලියන්නට අප සිතුවා. ඒ 2008 අවුරුද්ද ඉවර වුණ දෙසැම්බර් 31 වෙනි දා හවස කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී කෙරුණ අළුත් විදිහේ සද්කාර්යයක් ගැනයි. ගීතයක් ගැන සුල මුල කතා කරන ගී සදළුව ලිපියෙන් නැවුම් ආකාරයක ගායනා එකතුවක් එළි දැක්වුණ ඒ උත්සවයේ දී විද්වත් කථිකයින් කීප පොළක් ඒ ගායනාවල සුල මුල ගැන කී දේවල් කෙටියෙන් හරි ලියන එක වැදගත් කියලා හිතුවා.

විශාරද නන්දා මාලිනියගෙ හඬින් ගැයුණ "සිංහල පාලි ජයමංගල ගාථා, නරසීහ ගාථා සහ අටවිසි බුදු ගුණ" සංගත තැටිය ජනගත කළ උත්සවය සංවිානය කර තිබුණු ආකාරයත් නැවුම් බවක් පෑවා. කවාකාර ප්‍රේක්ෂකාගාරය මැද්දේ වුණ පීඨිකාව ගොක්කොල පුන්කලස් ඇතුලු සැරසිලිවලින් චාම් ලෙසින් පිළියෙල කරලා තිබුණා. බණ්ඩාර ඇහැළිය-ගොඩ ප්‍රවීණ ගීත රචකයාණන්ගේ උපදෙස් අනුව "ඉවෙන්ට්ස්" ආයතනය උත්සවය සංවිධානය කර තිබුණා. පීඨිකාව පසුපස පනවා තිබුණ අසුන්වල මූලාසනය හෙබවූ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමියන්, මාදුළුවාවේ සෝභිත හිමියන්, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය අගලකඩ සිරිසුමන හිමියන් යන ගරුතර සංඝරත්නය සමගින් මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ සහ විශාරද නන්දා මාලිනිය ප්‍රේක්ෂකයින්ට මුහුණ ලා අසුන්ගෙන සිටියා. ප්‍රේක්ෂකාගාරයේ මුල්ම කවයේ ජයමංගල ගාථා සිංහලයෙන් ලියූ ජ්‍යේෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න අටවිසි බුදුගුණ සිංහලයට පෙරලූ කවීන්ද්‍ර සිරිල් හේවාවසම් සහ ගායනාවන්ට තනු හා සංගීතය නිර්මාණය කර සංගීතවේදී රෝහණ විරසිංහ යන ප්‍රවීනයන් අසුන් ගත කර තිබුණ අතර, මෙම සද්කාර්ය ට උරදුන් "මහජන බැංකුවේ" වගකිව යුත්තන් මෙන්ම විශාල සම්භාවනීය පිරිසත් ආරාධනා ලැබ තිබුණා.

විශාරද නන්දා මාලිනියගේ මියුරු හඬින් සිංහල ජයමංගල ගාථා කීපයක් ගායනා වීමෙන් අනතුරුව කථක ක්‍රිෂාන්ත දයානන්ද ඇරයුම් කළේ මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ විද්වතාණන්ට යි. ඒ ජයමංගල ගාථා ගැන යමක් දෙසන්නට.

අපගේ පැරණි සම්ප්‍රදායට අනුව යමක් ගැන කථා කළ යුතු වන්නේ "අර්ථ පංචකයට" අනුවයි. අර්ථ පංචකයට "සංඥා" නැතිනම් "තම", "නිමිත්ත" නැතිනම් කුමක් සඳහා ද යන වග, "කත්-ථාර" නැතිනම් කතුවරයා , "පරිමාණ" නැත්නම් ප්‍රමාණය, "පයෝජන" නැත්නම් ප්‍රයෝජනය කියන අංග පහ ඇතුලත් වෙනවා. සංඥාව ගැන සිතුව හොත් "ජයමංගල" යන්න "ජය" "මං", "ගල" ලෙසින් මෙන් වෙන්ව ගත හැකියි. "ජය" යන්න සිංහලයේ එන අර්ථයට ගෙන දෙයි. "මං" - නරක ලෙසිනුත් "ගල" - දුරකරන ලෙසිනුත් අර්ථ දැක්වෙයි. භාරතීය සම්ප්‍රදායට අනුව පාද සතරක් ඇතතේ පද්‍යවලයි. ඊට අඩු හෝ වැඩි හද සංඛ්‍යාවක් ඇත්නම් ඒවා "ගාථා" වේ.

ජයමංගල ගාථා ගැයීමට හේතුව නැතුහොත් නිමිත්ත වූයේ 15 වෙනි සියවසේ තායිලන්තයේ වූ පරිසරයයි. බුරුම රජය විසන් තායිලන්තය යටපත් කරගෙන තිබුණා වූ ඒ වකවානුවේ තායිලන්ත රජුට ආශිර්වාදය පතා පතා ගැයීමට අඥාත තායිලන්ත හිමි නමක් විසින් පාලියෙන් රචනා කළ බවයි මහාචාර්වරයා පැවසුයේ. ඒ අනුව කත්ථාර නැත්තම් කතුවරයා වන්නේ ඒ නම නොදත් තායිලන්ත හිම නමයි. ලංකාවේ තරමට ම ඉහල මට්ටමක පාලි භාෂා ව්‍යවහාරය තායිලන්තයේ නො පැවැතුණ නිසාවෙන් ජයමංගල ගාථාවල ව්‍යාකරණ දෝෂ සහිත බවත් අලංකාර බව අඩු බවත් ය මහාචාර්යවරයා පැවසුයේ.

ජයමංගල ගාථා ප්‍රමාණය නවයකි. ඒවා රචනා වී ඇත්තේ "වසන්ත තිලකා" නම් වෘත්තයෙන්. වෘත්තය කියන්නේ අර්ථයන්, ශබ්දයන් දෙකම හැඟවෙන ලක්ෂණයට. ගායන වෙන සෘති, ස්වර රමණීය නිසා එය කරණ රසායන නැතිනම් ඇසීමට ප්‍රිය උපදවයි. සමාන අකුරු, සහ වහරේ දී මුඛයේ එකම තැනින් උපදින අකුරු නිසා ශබ්ද මාධූර්යය බහුලයි. මේ හේතුවෙන් ආවාහ විවාහ කටයුතු වලදී ප්‍රයෝජනයට ගැනෙයි. පේරුවට නැගීමේදී පාරිශුද්ධත්වයටත් විවාහ දිවියේදී මුහුණ දීමට ඇති අභියෝග හමුවේ නොසැලෙන්නටත් කෙරෙන ආශිර්වාදයකි ජයමංගල ගාථා.

රැපියෙල් තෙන්නකෝන් කවීන්ද්‍රයාණන් සිංහලයට පෙරලූ නරසීහ ගාථා ද ගායනාවන්ට පත් විය. නරසීහ ගාථා ගැන යමක් දේශනා කරන්නට පීඨිකාවට වැඩම කළේ මාදුළුවාවේ සෝභිත හිමියන් සිදුහත් කුමරුන් රජගෙයින් අභිනිෂ්ක්‍රමණය කර සය අවුරුද්දකට පසු බුද්ධත්වය ලබා සුද්ධොදන පිය රජතුමන්-ගේ ඇරයුමට අනුව නැවත රජමාලිගයට වැඩම කළ අන්දමත්, ඒ වෙනුවෙන් ජීවිතය කැප කළා වූ යශෝධරාවන් ඒ අවස්ථාවේ කටයුතු කළ ආකාරයත් සවිස්තරව විස්තර කළ සේක උන් වහන්සේ. පසු දු බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේ සමඟින් පිඩුසිඟා වඩිනවා දුටු යශෝදරාවන් සිය ස්වාමිපුරුෂයාණන්ව හුන් උන්වහන්සේ පිළිබඳව රාහුල පොඩි පුතුට කී ගාථාය නරසීහ ගාථා. උන්වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිළිබඳව ගැයූ ඇය ඒ සෑම ගාථාවක්ම අවසන් කළේ "ඒ නුඹගේ පියාණන් වහන්සේ ය" යනුවෙන්.

අටවිසි බුදුගුණ පිළිබඳව හැඳින්වීම කළේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය අගලකඩ සිරිසුමන හිමියන් දඹදෙණිය යුගයේ දී මහා සාහිත්‍ය කෘතීන් ජාතියට දායාද කළ දෙවෙනි පැරකුම්බා රජතුමත් කිසිවිටෙක බුදුබව පතා පින් පැතුවේ නැති බවත්, බුදු බවේ ඇති වටිනාකම රජතුමාට දැන්වීමට එකල එහි විසූ මයුරපාද පරිවේනාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් අටවිසි බුදු ගුණ රචනා වූ බවත් ය. උන්වහන්සේ දෙසූයේ. සැබැවින් ම නව අරහත් බුදුගුණ අතරින් එක් ගුණයක් වූ "අරහං" ගුණය පිළිබඳවයි අටවිසි බුදුගුණ ලියැවුණේ. අටවිසි පූජාවක් නිසාවෙන් ලැබෙන අසිරිය කියාපාමින් ලියැවුණ "පූජාවලිය" බුදුගුණ ගද්‍යපෙළ ග්‍රන්ථය මංගල හස්තියා පිට තබාගෙන දේ පෝය තිස්සේ පෙරහැර කරමින් ගෞරව කරන්නට තරම් රජතුමා උනන්දු වූ බවයි උනවහන්සේ සිහිපත් කළේ.

ආරාධිතයන්ගේ පමණක් සමන්විතව සංවිධානය කර තිබුණා වූ මෙම ජනගත කිරීමේ උත්සවයේ වරින් වර විශාරද නන්දා මාලිනියගේ ගායනාවන් ද විඳින්නට අවස්ථාව ලබා දුන් අතර සියළු ආරාධිතයින්ට සංගත තැටිය නොමිලේ පිරිනැමීමට ද සංවිධායකයෝ කටයුතු කර තිබිණ. රෝහණ ධර්මකීර්ති ප්‍රමුඛ වාද්‍ය වෘන්දය පසෙක සිට ගායනාවන්ට වාද්‍ය සහය සැපයීය.

ආරාධනා ලැබීමට වරම් ලද අපගේ ඒ අත්දැකීමයි මෙවර ගී සඳළුව පාඨකයින් හා බෙදා හදා ගත්තේ, නුදුරේදී සියළු රසිකයින් වෙත මම ගායනා රස විඳීමට අවස්ථාව මහජන බැංකුව විසින් සළසා දෙනු ඇත. ගී සඳළුව පාඨකයිනට ලැබුවා වූ නව වසර සුභ නව වසරක් වේවා යි මදක් පමා වී හෝ පතන්නටද ඉඩ ලබා ගන්නෙමු අපි.

සිසිර දිසානායක

<u>සිංහල ජයමංගල ගාථා</u>

දසත් යුගත්හි අවි යුත් ගෙන මාර සේනා
කෝපෙනි නැගි ගිරිමෙවුල් එක මාර දෙව්පුත්
දානාදි ධර්ම බලයෙන් දිනුවෝ මුනින්දෝ
ඒ තේජසින් ඔබට බෝ ජයමංගලම් වේ.

1වන ගාථාව
ජ්‍යේෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න

<u>සිංහල නරසීහ ගාථා</u>

සත් රුවනින් පළ රන් සුපතුල් වන්
දික් විලුමින් හොබනා ලකුණින් සන්
වල් විදුනා කුඩ රූ රැඳි පා යුත්
හේ ඔබ වේ යැ පියා නර සී වූ

1වන ගාථාව
කවීන්ද්‍ර රැපියෙල් තෙන්නකෝන්

<u>සිංහල අටවිසි බුදුගුණ</u>

කෙලෙසුන්ගෙන් පිරි ලොවට වැඩම කොට
වීර ගුණෙන් අගපත් වී මොනවට
සදහම් රස පෙවි බඹ සුර කරනට
තණ්හංකර බුදු හිමි සරණයි මට
1වන ගාථාව - කවීන්ද්‍ර සිරිල් හේවාවසම්

සංගත තැටිය සමඟින් බෙදා දුන් පොත් පිංචෙන් උපුටා ගැණින.